සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය<br>கண்டுபிடிப்பு சோதனை<br>Diagnostic Test | පැය 01 යි<br>01 மணி நேரம்<br>01 Hour |
| ඉතිහාසය I<br>வரலாறு I<br>History I | 11ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 |

- 1 - 40 ප්‍රශ්නවලට සපයා ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ප්‍රශ්න අංකයට අදාළ පිළිතුරු අංකය ඇති කවය තුළ (X) ලකුණු කරන්න.

01) ලංකාවේ ප්‍රාග් ඉතිහාසය හැදෑරීමට භාවිතා වන යෙදුමක් වන්නේ,

1) පුරාතන ශිලා යුගය
2) ඉහළ පුරාතන ශිලා යුගය
3) මධ්‍ය ශිලා යුගය
4) ක්‍රි.පූ. 2400 ට ය.

02) අභිලේඛන මූලාශ්‍රයට උදාහරණයකි,

1) ටොලමිගේ ලෝක සිතියම
2) දාඨා වංශය
3) වල්ලිපුරම් රන්පත
4) සීගිරි චිත්‍ර

03) ශ්‍රී ලංකාවේ මානව ජනාවාස පිළිබඳ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන මුල්ම ස්ථානය වන්නේ,

1) ඉරණමඩු සැකැස්මෙනි
2) පාහියන්ගල ලෙනෙනි
3) කුරුවිට බටදොඹලෙනෙනි
4) රත්නපුරය ආශ්‍රිත මැණික් පතල්වලිනි.

04) පහත දැක්වෙන වෘත්තිකයන් විසූ ගම්මාන නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

A - මැණික් කපන්නන්

B - ධීවරයන් විසූ ගම්

C - ගොපල්ලන් විසූ ගම්

D - වඩුවන් විසූ ගම්

1) කේවට්ටගාම, ගෝපාලගාම, වඩ්ඪතීගාම, මණිකාරගාම
2) මණිකාරගාම, වඩ්ඪතීගාම, ගෝපාලගාම, කේවට්ටගාම
3) මණිකාරගාම, කේවට්ටගාම, ගෝපාලගාම, වඩ්ඪතීගාම
4) මණිකාරගාම, ගෝපාලගාම, කේවට්ටගාම, වඩ්ඪතීගාම

05) ඉසුරුමුණි විහාරයේ පිහිටි මිනිසා සහ අශ්ව හිස දැක්වෙන මූර්තියෙන් නිරූපණය වන දෙවිවරුන් වන්නේ,

1) අග්නි හා පර්ජන්‍ය 2) අග්නි හා වරුණ

3) වරුණ හ පර්ජන්‍ය 4) ඉහත කිසිවක් නොවේ.

06) ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වූ පාහියංගල, බටදොඹලෙන අයත් වන්නේ පහත සඳහන් කුමන පරිසර කලාපයට ද?

1) පහතරට වියළි කලාපයට ය 2) පහතරට තෙත් කලාපයට ය

3) පහතරට අතරමැදි කලාපයට ය 4) අර්ධ ශුෂ්ක කලාපයට ය.

07) ප්‍රභුවරුන්ගේ සුඛිත මුදිත ජීවිතය පිළිබිඹු කරන පබළු මාලය හමු වී ඇත්තේ පහත කුමන ස්ථානයෙන් ද?

1) උඩරංචාමඩම නිවසෙන් 2) බෙරගල සුසාන භූමියෙන්

3) පාහියංගල සුසාන භූමියෙන් 4) ඉබ්බන්කටුව සුසාන භූමියෙන්

08) ඉරහඳ, වටාපොත, ඇත් අඩිය, ගොන්කුරය ආදී සලකුණු වලින් පෙන්නුම් කරන්නේ

1) චිත්‍ර කලාව පිළිබඳව ය 2) ප්‍රාදේශීය මායිම් පිළිබඳවය

3) සන්නිවේදන ක්‍රම පිළිබඳව ය 4) සංස්කෘතිය හා සමාජය පිළිබඳව ය

09) හේමමාලා සහ දන්ත කුමරු දන්ත ධාතූන් වහන්සේ මෙරටට වැඩම කරන ලද පැරණි වරාය වන්නේ,

1) දඹකොළ පටුන 2) මහාතිත්ථ 3) ගෝකණ්ණතිත්ථ 4) ලංකා පටුන

10) පෙතංගොඩ උයනේ දී උණ කටුවක් ඇණී විෂවීමෙන් මරණයට පත් වූ රජතුමා කවුරුන් ද?

1) I වන රාජසිංහ රජු ය. 2) VIII වන භුවනෙකබාහු රජු ය.

3) II වන රාජසිංහ රජු ය. 4) VII වන පරාක්‍රමබාහු රජු ය.

11) යකඩ නිස්සාරණය වන උෂ්ණත්වය වන්නේ

1) 1548 $^0$C 2) 1358 $^0$C 3) 1538 $^0$C 4) 1853 $^0$C

12) පරිසරය ආරක්ෂා කිරීමට නීති පැනවූ රජතුමා වන්නේ,

1) III වන උදය රජු ය. 2) II වන පරාක්‍රමබාහු රජු ය.

3) I වන දප්පුල රජු ය. 4) III වන මහින්ද රජු ය.

13) දියකැටපහන නම් වූ ජල කළමනාකරණ උපාංගය අයත් වන්නේ පහත කවර අංශයකට ද?

1) ඌරාකැට ළිඳට ය 2) සීගිරි ජලමල් තාක්ෂණයට ය

3) වාරි ඇළට ය 4) සොරොච්චට ය

14) මහවැලි ගඟේ අතු ගංගාවක් වන අඹන් ගඟ හරස් කර ඉදිකරන ලද ඇළ මාර්ගය,

1) යෝධ ඇළ 2) පබ්බන්ත ඇළ 3) ඇලහැර ඇළ 4) රිදී බැඳි ඇළ

15) දොළොස්වන සියවස වන විට ශ්‍රී ලංකාවේ ප්‍රභූන් අතර ජනප්‍රියව පැවති ආහාරයක් වූයේ සුවඳ ගිතෙලින් පිසූ මොණර මස් හා ඇල් සහලින් සෑදූ බත් බව සඳහන් මූලාශ්‍රය වන්නේ,

1) සද්ධර්මාලංකාරය　　2) සද්ධර්මරත්නාවලිය

3) පූජාවලිය　　4) නිකාය සංග්‍රහය

16) විහාරයට දානය පූජා කිරීමේ දී යම් ගැටලුකාරී තත්ත්වයක් පැන නැගුනහොත් දසගම් ඇත්තන් රැස්වී එය විසඳාගත යුතු බව සඳහන් සෙල් ලිපිය වන්නේ,

1) කළුදිය පොකුණ සෙල්ලිපිය　　2) ගල්පොත සෙල්ලිපිය

3) වෙස්සගිරිය සෙල්ලිපිය　　4) මිහින්තලා සෙල්ලිපිය

17) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන තෙක් ධර්මය රැක ගත්තේ මතක තබා ගැනීමෙනි. එසේ ධර්මය කටපාඩම් කරගත් භික්ෂූන් සෙල්ලිපි වල හඳුන්වා ඇත්තේ,

1) මහා ථෙරවරුන් ය　　2) භාණකවරුන් ය

3) අන්තේවාසික භික්ෂූන් ය　　4) සාමනේර භික්ෂූන් ය.

18) ● දඹදෙණි යුගයේ රජ කළ පාලකයෙකි.
● කළිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත නාමයෙන් පිදුම් ලැබීම.
● විදේශ ආක්‍රමණ ජයගත් කෙනෙකි.

ඉහත තොරතුරු හා සම්බන්ධ රජතුමා වන්නේ,

1) I වන භුවනෙකබාහු රජු ය.　　2) III වන විජයබාහු රජු ය.

3) II වන පරාක්‍රමබාහු රජු ය.　　4) IV වන භුවනෙකබාහු රජු ය.

19) ක්‍රි.ව. 1800 දී ෆෙඩ්රික් නෝත් ආණ්ඩුකාරවරයා උඩරටට යැවූ සේනා ප්‍රධානියා වූයේ,

1) ජෝන් ඩොයිල්　　2) මැක්ඩෝවල්　　3) බාබට්　　4) ඩග්ලස් විල්සන්

20) පහත දැක්වෙන්නේ මහනුවර යුගයේ ඒ ඒ කාර්යයන් සඳහා අය බදු වර්ගයි. මෙහි "අ" සහ "ආ" තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" | | "ආ" |
|---|---|---|
| 1. | මඩිගෙ බද්ද | A. ඇතුන් ඇල්ලීම |
| 2. | කුරුවේ බද්ද | B. රෙදි සේදීම |
| 3. | රදා බද්ද | C. වළන් තැනීම |
| 4. | බඩනැලි බද්ද | D. ප්‍රවාහන කටයුතු |

1) D A B C　　2) A B D E　　3) B A C D　　4) D A B C

21) රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන සහ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීමට පුරෝගාමී වූවන් වන්නේ,

1) රත්මලානේ ධම්මාලෝක හිමි, අනගාරික ධර්මපාල තුමා

2) වලානේ සිද්ධාර්ථ හිමි, හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

3) හික්කඩුවේ සුමංගල හිමි, හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

4) වලානේ සිද්ධාර්ථ හිමි, හික්කඩුවේ සුමංගල හිමි

22)

A - සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු බලවේග ඒකරාශි වීම

B - සහල් මිළ පහළ යාම නිසා වාමාංශික පක්ෂය මෙහෙයවූ හර්තාල් ව්‍යාපාරය නිසා 1953 අගමැති තනතුරින් ඉල්ලා අස්වීම.

C - ලොව ප්‍රථම අගමැතිනිය ලෙස පත්වීම

1) S.W.R.D බණ්ඩාරනායක, ඩඩ්ලි සේනානායක, සිරිමාවෝ බණ්ඩාරනායක

2) ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, S.W.R.D බණ්ඩාරනායක

3) S.W.R.D බණ්ඩාරනායක, ජෝන් කොතලාවල, සිරිමාවෝ බණ්ඩාරනායක

4) ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, සිරිමාවෝ බණ්ඩාරනායක

23) කඩිනම් මහවැලි ව්‍යාපාරයේ පහත සඳහන් ජලාශවලට ආධාර දුන් රටවල් පිළිවෙළින්

1. කොත්මලේ ජලාශය
2. රන්දෙණිගල ජලාශය

1) බටහිර ජර්මනිය, මහා බ්‍රිතාන්‍යය 2) ස්වීඩනය, බටහිර ජර්මනිය

3) චීනය, ස්වීඩනය 4) මහා බ්‍රිතාන්‍යය, චීනය

24) 1848 දෙවන නිදහස් අරගලයට බලපෑ දීර්ඝකාලීන හේතුව වන්නේ,

1) 1815 උඩරට ගිවිසුම ය 2) ටොරිංටන් සාමිගේ බදු ප්‍රතිපත්තිය

3) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වල බලපෑම ය. 4) ද්විත්ව පාලනය අහෝසි වීම ය

25) A. E. ගුණසිංහ, නඩේසර් අයියර් යන නායකයන් දෙදෙනාටම සම්බන්ධ පොදු කරුණ පහත දී ඇති ප්‍රකාශ අතුරින් තෝරන්න.

1) 19 වන සියවසේ දේශපාලන පක්ෂ ඇරඹීම

2) බෞද්ධ හා හින්දු ප්‍රබෝධය ඇති කිරීම

3) දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීමට කටයුතු කිරීම

4) කම්කරුවන්ට තම වෘත්තිය අයිතිවාසිකම් දිනාගැනීමට මෙහෙයවීම

26) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය නිසා හටගත් පහත දැක්වෙන වෙනස්කම් අතරින් සංස්කෘතික වෙනස්කම් දෙකක් දැක්වෙන පිළිතුර කුමක් ද?

A - කම්කරු පංතියක් බිහි වීම

B - බටහිර ඇඳුම් පැළඳුම් ආචාරවිධි මෙරට සමාජගත වීම

C - බටහිර අධ්‍යාපනය ව්‍යාප්ත වීම

D - වැටුපට වැඩකරන ශ්‍රමික පිරිසක් බිහිවීම

E - වෘත්තීය සංගම් පිහිටවූී ම

1) B හා C 2) C හා D 3) B හා E 4) C හා E

27) ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති වරයා ලෙස පත් වුයේ කවුරුන් ද?

1) සර් ඩී. බී. ජයතිලක මහතා 2) පොන්නම්බලම් අරුණාචලම් මහතා

3) F.R. සේනානායක මහතා 4) පොන්නම්බලම් රාමනාදන් මහතා

28) උඩරට රජුන් සමග කටයුතු කිරීමේ දී ලන්දේසීන් අනුගමනය කළ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණය වූයේ,

1) හැකිතාක් ආර්ථික ලාභ ලබා ගැනීම ය
2) රෙපරමාදු ආගම ප්‍රචාරය කිරීම ය
3) උඩරට රාජ්‍යයේ කොටස් අල්ලා ගැනීම ය
4) විදේශ සබඳතා අවහිර කිරීම ය

29) ශ්‍රී ලංකාවේ පැරණිතම දේශපාලන පක්ෂය කුමක් ද?

1) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
2) ලංකා සමසමාජ පක්ෂය
3) එක්සත් ජාතික පක්ෂය
4) ලංකා කොමියුනිස්ට් පක්ෂය

30) යාපන රාජ්‍යය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය මින් කුමක් ද?

1) විජය කුලංකෙ යාපනයේ ආරම්භක පාලකයා යි.
2) පෘතුගීසි විරෝධී වීදිය බණ්ඩාර ආරක්ෂාව පතා යාපනයට යාම.
3) යාල්පාන වෛපවමාලෙ නැමැති ග්‍රන්ථයේ යාපනය පිළිබඳ තොරතුරු ඇතුළත් ය.
4) යාපනය කුරුඳු වලට ප්‍රසිද්ධ නිසා පෘතුගීසීන් ගේ අවධානයට යොමු වීම.

31) ධනපති, කම්කරු, මධ්‍යම යනුවෙන් සමාජ පන්ති තුනක් නිර්මාණය වුයේ කුමක ප්‍රතිඵලයක් ලෙසට ද?

1) කාර්මික විප්ලවය
2) ප්‍රංශ විප්ලවය
3) පුනරුදය
4) ඇමරිකන් නිදහස් සටන

32) යුරෝපයේ පුනරුද සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වැදගත්ම වෙනස වන්නේ,

1) වංශාධිපති වරුන්ගේ බලය වර්ධනය වීමයි
2) රජුගේ බලතල සීමා වීමයි
3) යටත් විජිත පිහිටුවා ගැනීමයි
4) ප්‍රාදේශීය රාජ්‍ය වෙනුවට ජාතික රාජ්‍ය බිහි වීමයි.

- පහත **A, B, C, D** ලෙස දක්වා ඇති යුගල අධ්‍යයනය කර 33, 34, 35 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. 1. ලුණු හා කුරුඳු ඒකාධිකාරය අහෝසි කිරීම.
   2. පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල යෙදීම

B. 1. කෝපි වගාව
   2. හැමිලියා වෙස්ටර්ට්‍රික්ස්

C. 1. තේ වගාව
   2. ලූල් කඳුකර වතු යාය

D. 1. පොල් වගාව
   2. ජේම්ස් ටේලර්

33) පළමු වැන්න නිසා දෙවැන්නේ වර්ධනය පෙන්වන යුගලය කුමක් ද?

1) A　　2) B　　3) C　　4) D

34) පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු සම්බන්ධයක් නොමැත

1) A　　2) B　　3) C　　4) D

35) දෙවැන්න පළමුවැන්නේ විනාශයට හේතුවන බව පෙන්වන යුගලය කුමක් ද?

1) A   2) B   3) C   4) D

36) මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ පොල්ගොල්ල හැරවුමෙන් සුදු ගඟට එකතු වන ජලය වියළි කලාපීය වැව්වලට බෙදාහැරීම සිදු වන්නේ කුමන ජලාශයට එකතු වීමෙන් ද

1) වික්ටෝරියා   2) කොත්මලේ   3) බෝවතැන්න   4) රන්ටැඹේ

37) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන වගන්තියේ සඳහන් වන්නේ පහත සඳහන් කුමන කරුණ පිළිබඳව ද?

1) අගමැති හා අමාත්‍ය මණ්ඩලය

2) අධිකරණ පද්ධතිය හා යුක්තිය පසඳි ලීම

3) ජාතික රාජ්‍ය සභාව හා නීති සම්පාදනය

4) මූලික මිනිස් අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහස

38) ලංකාවේ වී වගාව  දියුණු කිරීමට සහතික මිල ක්‍රමය හඳුන්වා දෙනු ලැබුවේ,

1) 1942   2) 1943   3) 1945   4) 1947

39) 1872 සුළු අපනයන පර්යේෂණ ආයතනය පිහිටි ස්ථානය වන්නේ

1) මාතලේ   2) නාවලපිටිය   3) කුණ්ඩසාලේ   4) නාරම්මල

40) ලංකාවේ ප්‍රථම කාර්මික ජනපදය වූයේ

1) සීතාවක   2) ඒකල   3) රත්මලාන   4) බියගම